# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2065/62 - 2018 අප්‍රේල් මස 06 වැනි සිකුරාදා - 2018.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

2017 අංක 02 දරන පළාත් පාලන ආයතන බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රඥප්තිය

පහත උප ලේඛනයේ සඳහන් 2017 අංක 02 දරන පළාත් පාලන ආයතන බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රඥප්තිය 2017.09.19 දින බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කිරීමෙන් අනතුරුව 2017.10.19 දින බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව ලබා දී ඇති බවත් ඒ අනුව එකී ප්‍රඥප්තිය 2017.10.19 දින සිට බස්නාහිර පළාත තුළ බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරමි.

ඉසුර දේවප්‍රිය,
බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා
මුදල්, ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන,
පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති,
පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන හා
සංචාරක කටයුතු අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

2018 අප්‍රේල් මස 04 වෙනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

**බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2017 අංක 02 දරන පළාත් පාලන ආයතන බලතල ක්‍රියාත්මක කිරීමේ ප්‍රඥප්තිය**

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක පළාත් පාලන ආයතනයන්හි කර්තව්‍ය සඳහා හේතු වන කවර හෝ සංවර්ධන කාර්යයක් සඳහා සූදනම් කෙරෙන ඉඩම සහ, ඉඩම් අනුබෙදුම් සඳහා සැලසුම්, සියළු ඉදිකිරීම් සැලසුම් පරීක්ෂා කිරීම ද ඊට අදාළව නියමයන් කිරීම ඇතුළු එම සැලසුම් අනුමත කිරීම ද ඒ සඳහා නිවාස හා නගර සංවර්ධන ආඥාපනතෙහි විධිවිධාන හා නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතෙහි විධිවිධාන බලපැවැත්වීම සඳහා ද, ඊට ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන වෙත බලතල නිශ්චිත කිරීම සඳහා ද විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 23 වන වගන්තියෙහි (1), (2), (3) හා (4) වන උපවගන්තීන්ට ද අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය**

මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2017 අංක 02 දරන පළාත් පාලන ආයතන බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර එය ආණ්ඩුකාරවරයා විසින් අනුමතය ලබා දෙන දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

**ප්‍රඥප්තියේ අරමුණු**

1. මෙම ප්‍රඥප්තියෙහි අරමුණු පහත පරිදි වන්නේ ය.

(i) පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් තුළ නේවාසික, කාර්මික, වාණිජ පරමාර්ථයන් සඳහා ඉඩම් හා ඉඩම් අනුබෙදුම් සැලසුම්, ගොඩනැගිලි ඉදිකිරීම් සැලසුම් හෝ වෙනත් ඕනෑම සංවර්ධන ව්‍යාපෘතියකට අදාළ සැළසුම් පළාත් පාලන ආයතනයක් හෝ එහි නගරාධිපති, සභාපති විසින් අනුමත කිරීම, පරීක්ෂා කිරීම හා අවශ්‍ය නියමයන් කිරීම.

(ii) පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් තුළ නේවාසික, කාර්මික, වාණිජ පරමාර්ථයන් සඳහා ඉඩම් හා ඉඩම් අනුබෙදුම් සැලසුම්, ගොඩනැගිලි ඉදිකිරීම් සැලසුම් හෝ වෙනත් ඕනෑම සංවර්ධන ව්‍යාපෘතියකට අදාළ සැලසුම් පළාත් පාලන ආයතනයක් හෝ එහි නගරාධිපති, සභාපති විසින් අනුමත කිරීම, පරීක්ෂා කිරීම හා අවශ්‍ය නියමයන් කිරීමට අදාළ ලිඛිත නීතිය නිශ්චිත කිරීම.

(iii) පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ සහ නගර හා ග්‍රාම සංවර්ධන ආඥාපනතේ විධිවිධාන බලපැවැත්වීම සඳහා විධිවිධාන සැළසීම.

**නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන බලපැවැත්වීම.**

2. බස්නාහිර පළාත තුළ යම් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක නේවාසික, කාර්මික, වාණිජ්‍ය කාර්යන් සඳහා භාවිතය පිණිස ඉඩම් කොටසක් හෝ ඉඩම් අනුබෙදුමකට අදාළ සැලැස්මක්, ස්ථිර ඉදිකිරීමකට අදාළ ගොඩනැගිලි සැලැස්මක් හෝ එවැනි සැලැස්මකට අදාළ සංශෝධනයක් හෝ වෙනත් ඕනෑම සංවර්ධන ව්‍යාපෘතියකට අදාළ සැලැස්මක්, නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන අනුව පළාත් පාලන ආයතනයකට, නගරාධිපතිවරයෙකුට සභාපතිවරයෙකුට අනුමත කිරීමට ක්‍රියාත්මක කරවීමට හෝ ඊට අදාළ නියමයන් කිරීමට හෝ නිවාස හා නගර සංවර්ධන ආඥාපනත යටතේ සඳහන් බලතල පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක ක්‍රියාත්මක කිරීම, කාර්යන් ඉටුකිරීම හෝ කටයුත්තක් කිරීම වළක්වන ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ සඳහන් කවර හෝ විධිවිධානයක් හෝ ඒ යටතේ කරන ලද කවර හෝ නියමයක් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වීම මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් බල රහිත විය යුතු ය.

3. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනෙන් පසු බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක ඉඩම් කොටසකට හෝ ඉඩම් අනුබෙදුමකට අදාළ සැලැස්මක්, ස්ථිර ඉදිකිරීමකට අදාළ ගොඩනැගිලි සැලැස්මක් හෝ එවැනි සැලැස්මකට අදාළ සංශෝධනයක් හෝ වෙනත් ඕනෑම සංවර්ධන ව්‍යාපෘතියකට අදාළ සැලැස්මක් අනුමත කිරීම සංවර්ධන කාර්යයන් සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම, අනුකූල සහතිකයක් නිකුත් කිරීම, අනවසර ඉදිකිරීම් සඳහා නීතිමය පියවර ගැනීම සහ ඊට ආනුශංගික කාර්යයන් පළාත් පාලන ආයතන වල නගරාධිපති, සභාපති, නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධානයන්ට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු ය.

**රීති සෑදීම**

4. (i) මෙම ප්‍රඥප්තිය යටතේ අරමුණට අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළ කවර හෝ කාරණාවක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ රීති සාදනු ලැබිය හැකිය.

(ii) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය පළවූ දිනයේ සිට හෝ ගැසට් පත්‍රයේ සඳහන් ඉදිරි දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(iii) අමාත්‍යවරයා විසින් සාදන ලද රීති ගැසට් පත්‍රයේ පළ වීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව එකී රීති අනුමත කර එකී අනුමැතිය පිළිබඳව ගැසට් පත්‍රයක් මගින් නිවේදනය කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබුවහොත් ඒ බවද ගැසට් පත්‍රයක් මගින් නිවේදනය කළ යුතු අතර එදින සිට එම රීති, ඒ යටතේ එතෙක් ගන්නා ලද ක්‍රියාමාර්ගයන්ට අගතියකින් තොරව පරිච්ඡින්න වූවා සේ සැලකිය යුතු ය.

**අර්ථ නිරූපණය**

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියේ

''පළාත් පාලන ආයතන'' යන්නෙන් බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා අදහස් වන්නේ ය.

''සභාපතිවරයා'' යන්නෙන් නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් තේරී පත්වී ඇති සභාපතිවරයා අදහස් වන්නේ ය.

''නගරාධිපතිවරයා'' යන්නෙන් මහ නගර සභාව වෙනුවෙන් තේරී පත් වී ඇති නගරාධිපතිවරයා අදහස් වන්නේ ය.

''අමාත්‍යවරයා'' යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා අදහස් වන්නේ ය.

මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

04 - 790

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.